පුවත් වාර්තාවන්, ලිපි හෝ ඡායාරූප පුවත් සඳහා සිරස්තල යෙදීමේදී නිර්මාණශීලී වීමට බොහෝ විට මාධ්‍ය උත්සාහ කිරීම දක්නට ලැබෙන කරුණකි. එහි කිසිදු ගැටළුවක් නොමැත. කෙසේ වුවත්, එසේ සිරස්තල සම්බන්ධයෙන් නිර්මාණශීලී වීමේදී, ඒ ඔස්සේ කොන් කිරීම් සහ ගැරහීම් ඇති නොකිරීමට ප්‍රවේසම් විය යුතුය.

සමේ වර්ණය ඔස්සේ ශ්‍රී ලංකාවේ විදේශිකයින්ව හැඳින්වීමේ භාවිතාව ඊට නිදසුනකි. "සුද්දා", "සුද්දි", "සුදු කත" වැනි ආකාරයේ සමේ වර්ණය පදනම් කරගනිමින් විදේශිකයින්ව හැඳින්වීම, බොහෝ විට මාධ්‍ය තුළ දක්නට ලැබේ.

ලංකාදීප පුවත්පතේ (සැප්.28, 2022) ඡායාරූප පුවතක සිරස්තලය උදාහරණ ලෙස ගත හැක.

1) ඔබ සිතන ලෙසට "සුදු නෝනලා" යනුවෙන් විදේශිකයින්ව හැඳින්වීම ඔස්සේ, ඔවුන්ගේ සමේ වර්ණය පදනම් කරගත් කොන් කිරීමක් සිදු නොවන්නේ ද? ඒ වෙනුවට, සමේ වර්ණය අදාළ කර නොගන්නා යෙදුම් භාවිතා කළ නොහැකිද?

2) සංචාරක කර්මාන්තය ආර්ථිකයේ සැලකිය යුතු තැනක් ගන්නා රටක් වශයෙන් ගත් විටද, එවැනි කොන් කිරීමේ ආකල්ප ප්‍රවර්ධනය කිරීම ගැටළුකාරී නොවන්නේද?

සමේ වර්ණය ඔස්සේ විදේශිකයන්ව කොන් කිරීමෙන් වළකිමු!